CAT II

Level 6.

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව - VI වන මට්ටම**
**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2014/2015**
**කම්කරු නීතිය - LWU4323**
**කාලය - පැය එකයි.**

---

**දිනය - 2015 නොවැම්බර් 12 වන දින** **වේලාව - ප.ව.01.30- ප.ව. 02.30 දක්වා**

---

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**
**අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

01. රවී, ප්‍රභාත් සහ උපුල් රෙඩ් ලයින් ගාමන්ට්ස් (පුද්ගලික) සමාගමේ සේවකයෝ වෙති. ඔවුන්ගේ වාර්ෂික වැටුප් වර්ධක සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාරීත්වය හා ඔවුන් අතර ආරවුලක් පවතී. සමාගම් කළමනාකාරීත්වය ආරවුල නිරාකරණය කිරීම සඳහා මැලිකමක් දක්වයි. එහෙයින්, ආරවුල නිරාකරණය කර ගැනීම සඳහා ඔවුහු රජයේ මැදිහත්වීම ලබා ගැනීමට අපේක්ෂා කරති.

පහත කරුණු සම්බන්ධයෙන් රවී, ප්‍රභාත් සහ උපුල් ඔබගේ උපදෙස් ලබා ගැනීමට අදහස් කර ඇත.

(අ) කම්කරු කොමසාරිස්වරයාගේ මැදිහත්වීම සහිතව ඔවුන්ගේ ආරවුලට විසඳුමක් ලබා ගැනීම සඳහා කාර්මික ආරවුල් පනත තුළ යම් ප්‍රතිපාදනයක් පවතී ද? **(ලකුණු 10)**

(ආ) කොමසාරිස්වරයාගේ මැදිහත්වීම අසාර්ථක වුවහොත්, ඔවුන්ගේ ආරවුල නිරාකරණය කර ගැනීම සඳහා කම්කරු අමාත්‍යවරයාට මැදිහත් වීමට හැකියාවක් පවතී ද? **(ලකුණු 10)**

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් රවී, ප්‍රභාත් සහ උපුල් හට උපදෙස් දෙන්න.

02. “හුදු පුද්ගලික කලහයක් හෝ අවලාදයක් හෝ කැළඹීමක් කාර්මික ආරවුලක් නොවිය හැක. නිර්වචනය තුළට වැටෙන්නේ, සියලුම ආරවුල් හෝ විෂමතා නොවන, නමුත් නිශ්චිතව අර්ථනිරූපිත පාර්ශ්වයන් අතර නිශ්චිත පැහැදිලි කරුණු සම්බන්ධයෙන් වූ ආරවුල් පමණි.”

**De Silva, S.R, Legal Framework of Industrial Relations in Ceylon, 1973 at p.248**

සංශෝධිත 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ ‘කාර්මික ආරවුලක්’ සඳහා ලබාදී ඇති අර්ථ නිරූපණය ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුතාව සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය ඇසුරින් තහවුරු කළ යුතුය.

**(ලකුණු 20)**

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME – LEVEL 6**
**CONTINUOUS ASSESSMENT TEST II– 2014/2015**
**LWU4323– LABOUR LAW**
**DURATION: 01 HOUR.**

**DATE: 12th November 2015** **TIME: 1.30 p.m. – 2.30 p.m.**

**Answer one (01) question only**

**Candidates will be penalized for illegible handwriting.**

01. Ravi, Prabath and Upul are employees of Red Line Garments (Pvt.) Ltd. They have a dispute with the management of the Company regarding their annual increments. The management of the Company is reluctant to settle the dispute. They wish to seek the intervention of the State to settle the dispute.

Ravi, Prabatha and Upul wish to get your advice as to the following:

a) Whether the Industrial Dispute Act has any provision to find a settlement to their dispute with the intervention of the Commissioner of Labour.

**(10 marks)**

b) If the intervention of the Commissioner fails, would it be possible to the Minister of Labour to intervene to settle their dispute.

**(10 marks)**

Advise Ravi, Prabath and Upul with reference to statutory provisions and case law.

02. "A mere personal quarrel or grumbling or an agitation would not be an industrial dispute. It is not all disputes or differences but only those between certain defined parties relating to certain definite matters that come within the definition"

**De Silva, S.R, *Legal Framework of Industrial Relations in Ceylon,* 1973 at p. 248.**

Discuss the validity of the above statement in light of the interpretation given to 'industrial dispute' in the Industrial Dispute Act, No. 43 of 1950 as amended.

Your answer should be supported with relevant statutory provisions and case law.

**(20 marks)**

*-Copyrights reserved-*